263

# භාෂෝත්පාදනය හා සිංහල පුවත්පත්

('කවට කතිකයා' පළමු සිංහල භාෂෝත්පාදක පුවත්පතට විශේෂිත ව කෙරෙන සන්නිවේදනාත්මක අධ්‍යයනයක්)


| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 263 |
| වර්ග අංකය | |


ඩබ්ලිව්. පී. අමරසේන

(අමර පී. වීරසිංහ)

MACO/R/46/98

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ ජන සන්නිවේදනය පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

2000 නොවැම්බර්

# නිබන්ධ සාරාංශය


හාස්‍යෝත්පාදක පුවත්පත් සිංහල පාඨකයනට ප්‍රථම වරට හඳුන්වා දුන්නේ වත්තල තෙළහපාත, ගුරුන්නාන්සේලාගේ දොන් පැලිස් අප්පුහාමි ය. ඒ 1872 ආරම්භ කළ "කවට කතිකයා" පුවත්පත මගිනි. මෙම ප්‍රථම හාස්‍යෝත්පාදක පුවත්පත දසක හතරක් පමණ ප්‍රකාශයට පත් කැර ඇති අතර එය අභාවයට ගොස් ඇත්තේ එහි කර්තෘත්වය දැරූ පැලිස් අප්පුහාමිගේ මරණයත් සමඟ ය. ඒ 1910 වර්ෂයේ දී ය.

ප්‍රථම හාස්‍යෝත්පාදක පුවත්පතේ ආරම්භයේ සිට අවසානය දක්වා වූ කාල සීමාව (1872 – 1910) ලාංකිකයා ආර්ථික සාමාජික, දේශපාලනික හා සංස්කෘතිකමය වශයෙන් දැඩි ලෙස වෙනස් වෙමින් තිබුණු කාල පරාසයකට අයත් වෙයි. මෙසේ සමස්ත සමාජ ක්‍රියාවලිය ම නොසන්සුන් වී වෙනස් වෙමින් පවතිද්දී මුල් වරට හාස්‍යය හා උපහාසය එදා පුවත්පත් මාධ්‍යයට මුසු කැර ගනිමින් "කවට කතිකයා" පුවත්පත ඉටු කළ සමාජ මෙහෙවරේ ස්වභාවය කෙබඳු වීද?

අධිරාජ්‍යවාදී ග්‍රහනයට නතුව තිබූ ලංකාවේ ආර්ථික, සාමාජික, දේශපාලනික හා සංස්කෘතිකමය බලවේග කෙරෙහි "කවට කතිකයා"ත් එහි කර්තෘ පැලිස් අප්පුහාමිත් කළ බලපෑම කෙබඳු ද?

සන්නිවේදනාත්මක දෘෂ්ටි කෝණයකින් මෙම ගැටලු විග්‍රහ කිරීමේදී මූලික වශයෙන් ඉවහල් වූයේ මූලාශ්‍ර අධ්‍යයනය යි. ජාතික ලේඛනාගාරයේ තැන්පත් ව ඇති කියැවිය හැකි මට්ටමේ පවත්නා සියලු ම "කවට කතිකයා" කලාප මෙම අධ්‍යයනට හසු විය. මේ පිළිබඳ තොරතුරු දන්නා වයෝවෘද්ධ කිහිප දෙනකු සමඟ කරන ලද සාකච්ඡා ද මෙම අධ්‍යයනයේ එක් කොටසකි.

මෙම අධ්‍යයනයෙන් සොයා ගත් කරුණු අනුව අපට නිගමන කිහිපයක් ඉදිරිපත් කළ හැකි ය.

- කවට කතිකයා ලංකාවේ පුවත්පත් විෂය ක්ෂේත්‍රයේ ඉම පුළුල් කළ පුවත්පතකි.
- ශ්‍රී ලංකා පුවත්පත් ඉතිහාසයේ විකල්පීය එළැඹුමකින් (Alternative approach) යුතුව පුවත් පළ කළ ප්‍රථම පුවත්පත යි.
- සමාජ පීඩක ප්‍රභූ සමාජයට එරෙහි ජන මතයක් ගොඩ නඟා ඊට නායකත්වය දී ජාතික පුනරුද ව්‍යාපාරයට අනුබල දුන් මාධ්‍යයකි.
- විසිවන සියවස ආරම්භයේ බිහි වන ප්‍රබන්ධ කතා සාහිත්‍යයේ පෝෂණයට අවශ්‍ය පසුබිම සකස් කැරුණේ ද "කවට කතිකයා" ප්‍රමුඛ හාස්‍යෝත්පාදක පුවත්පත් මඟිනි.
- නූතනයේ පුවත්පත් සන්නිවේදන ක්‍රියාවලියේ දී භාවිත වන බොහෝ සන්නිවේදන උපක්‍රම කවට කතිකයා තුළින් හඳුනා ගන්නට ලැබීම සන්නිවේදන පදාර්ථීන්ගේ අවධානය ලක් විය යුතු විශේෂ ලක්ෂණයක් ලෙස හැඳින් විය හැකි ය.

පුස්තකාලය
කැලණිය විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව)
කැලණිය.

අවසන් වශයෙන්, ලංකාවේ ප්‍රථම හාස්‍යෝත්පාදක පුවත්පත වන කවට කතිකයාත්, එහි නිර්මාතෘ ජී.ඩී. පැලිස් අප්පුහාමි නම් වූ සන්නිවේදකයාගේ භූමිකාවත් අධ්‍යයනය කිරීම වත්මන් පුවත්පත් සන්නිවේදකයනට සිය කාර්යය වඩාත් නිර්මාණශීලී මට්ටමකින් පවත්වා ගෙන යෑමට ඉවහල් වන බව ද සඳහන් කළ යුතු ය.